**ශීර්ෂය 324 - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව**

---------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 මතය**

--------

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

-------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මෙහෙයුම් සමාලෝචනය

## 2.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලසුමේ දක්වා ඇති කාර්යයන්වල අරමුණු අපේක්ෂා කළ මට්ටමෙන් ඉටුකර ගැනීමට නොහැකිවූ අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලසුමේ දක්වා ඇති පළාත් පාලන ආයතනවල සහ පළාත් සභාවල අභ්‍යන්තර විගණන ඒකක විධිමත් කිරීම සහ ශක්තිමත් කිරීම යටතේ විවිධ පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල පවත්වනු ලබන පුහුණු වැඩමුළු අපේක්ෂිත ලෙස මුළුමනින්ම ඉටුකර ගැනීමට නොහැකිවී තිබූ අතර, එහි ප්‍රගතිය සියයට 50 කටත් වඩා අඩු වී තිබුණි. | 2021 වර්ෂය සඳහා පළාත් සභා හා පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීමට සූදානම් කර තිබුණද 2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගතය හේතුවෙන් එම පුහුණු වැඩමුළු අපේක්ෂිත පරිදි නොපැවැත්වුණි. දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය සඳහා පුහුණු වැඩමුළු 10 ක් පැවැත්වූ අතර එම වැඩමුළු අතරින් 4 ක් සඳහා පළාත් සභා හා පළාත් පාලන අභ්‍යන්තර විගණකවරුන් සහභාගී කරවා ගන්නා ලදි. | ඉලක්කගත කාර්යසාධන මට්ටම් කරා ළඟාවීමට උපරිම වශයෙන් කටයුතු කළ යුතු වීම. |
| (ආ) | වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලසුමේ දක්වා ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල විගණන හා කළමනාකරණ කමිටුවලදී පැන නැගුණු ගැටළු සම්බන්ධව ක්‍රියා කිරීම සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් ඉදිරිපත් කරන ලද කාර්තු වාර්තා ඇගයීම සඳහා ලබාගැනීම යන කාර්යයන් සියල්ල ඉටුකිරීමට අපේක්ෂා කර තිබුණු නමුත්, අපේක්ෂිත ලෙස එම කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල විගණන හා කළමනාකරණ කමිටු වලදී මතුවන ගැටළු සම්බන්ධව ක්‍රියා කිරීම කිහිප ආකාරයකට සිදු වේ. දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටු කාර්තු හතර තුළදී පවත්වන අතර ඒ ඒ කමිටුවේදී මතුවන ගැටළු සඳහා ඒ ඒ කාල සීමාවලදී විසඳුම් ලබාදීමේ කටයුතු සිදු කෙරේ.<br><br>ඇතැම් කරුණු සම්බන්ධව ක්‍රියා කිරීමට දෙපාර්තමේන්තුවෙන් පිට වෙනත් ආයතන සමග කටයුතු කලයුතු බැවින් යම් කාල සීමාවක් ගත වේ.<br><br>2021 වර්ෂයේ පැවති කොවිඩ් තත්ත්වය හමුවේ කාර්යාලවල රාජකාරි කටයුතු අඛණ්ඩව සිදුකිරීමට නොහැකි වීම මත අදාළ වාර්තා නියමිත දිනවලට ලබා ගැනීමට නොහැකි වූ අතර, ඒ අනුව සියළුම වාර්තා ප්‍රමාද විය. එම නිසා එහි ප්‍රගතිය සියයට 85 විය. | ඉලක්කගත කාර්යසාධන මට්ටම් කරා ළඟාවීමට උපරිම වශයෙන් කටයුතු කළ යුතු වීම. |

**3.** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දින වන විට සමස්ථ අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 07 ක් පුරප්පාඩුව පැවැතුණි. | 2021.12.31 දින වනවිට මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩු 07 ක් පැවතුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |